# <u>පුවත්පත් නිවේදනය</u>

## <u>2017 වසර තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය</u>

**වාර්ක ආදායම සහ වර්ධන වේගය**

2016 වසර තුළ ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍ර ව්‍යාපාර යන ද්විත්ව අංශය සඳහා සමස්ත දළ ලිඛිත වාරිකයෙහි (GWP) 15.07% වර්ධනයක් අත්කර ගැනීමට සමත් විය. 2016 වසරේ දී පැවති රුපියල් මිලියන 143,067 ට සාපේක්ෂව රුපියල් මිලියන 21,556 ක වැඩිවීමක් වාර්තා කරමින් 2017 වසර තුළ අංශ දෙක සඳහා මුළු දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 164,623 ක් විය.

2017 වසරේ දී දීර්ඝකාලීන රක්ෂණ අංශයෙන් උත්පාදනය කරන ලද දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 71,504 ක් වූ අතර මෙය 2016 වසරේ උත්පාදනය කරන ලද රුපියල් මිලියන 63,477 ට අනුව 12.65% වර්ධනයකි. 2017 දී සාමාන්‍ය රක්ෂණ අංශය වාර්තාකළ දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 93,119 ක් වූ අතර, 2016 දී වාර්තාකළ රුපියල් මිලියන 79,590 ට සාපේක්ෂව 17%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

2017 වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි අනිවාර්ය ප්‍රතිරක්ෂණ පවරාදීම් මඟින් ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) විසින් උත්පාදනය කළ ප්‍රතිරක්ෂණ වාරික ආදායම රුපියල් මිලියන 3,683 ක් වූ අතර, 2016 වසරේ උත්පාදනය කළ රුපියල් මිලියන 2,397 ක් වූ ප්‍රතිරක්ෂණ වාරිකවලට අනුව 53.65% ක සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ වාරිකය 2017 දී සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල පුළුල් පරාසයක පිහිටි විවිධ වර්ගයේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර පිළිගැනීම හේතුවිය.

**ප්‍රස්තාරය 1 - දළ ලිඛිත වාරික ආදායම**



**රක්ෂණ විනිවිදභාවය සහ ඝනත්වය**

දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස රක්ෂණ වාරික ආදායම පිළිබිඹු කරන රක්ෂණ විනිවිදභාවය 2017 වසරේ දී 1.24% ක් විය. 2016 වසරේ වාර්තා වූ අගය වන 1.20%ට සාපේක්ෂව 2017 වසර තුළ රක්ෂණ විනිවිදභාවය සුළු වශයෙන් ඉහළ ගොස් තිබුණද, ආසියානු කලාපයේ අනිකුත් රටවල් බොහොමයකට සාපේක්ෂව එය තවමත් පහළ මට්ටමක පවතී. 2017 වසරේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයන්හි විනිවිදභාවය 0.54% (2016: 0.53%)ක්ද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි විනිවිදභාවය 0.70% (2016:0.67%) ක් ද වූ අතර, 2016 වසරේ වාර්තා වූ විනිවිදභාවයෙහි අනුපාතයන්ට සාපේක්ෂව එම දෙවර්ගයෙහිම සුළු වැඩිවීමක් වාර්තා කරන ලදී.

රක්ෂණ ඝනත්වය යන්නෙන් ජනගහනයෙහි එක් පුද්ගලයෙක් සඳහා වන රක්ෂණ වාරික ආදායම පිළිබිඹු වන අතර, එය 13.78%ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2016 වාර්තාගත රුපියල් මිලියන 6,747 ට සාපේක්ෂව රුපියල් මිලියන 7,677ක් දක්වා ඉහළ ගිය අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් ජනගහනයෙහි සුළු වැඩිවීමට අනුව වාරික ආදායම ඉහළ යාම හේතු විය.

**මුළු වත්කම්**

රක්ෂණ සමාගම්වල මුළු වත්කම්වල වටිනාකම 2016 දී වාර්තාකළ රුපියල් මිලියන 525,190 ට සාපේක්ෂව 10.89% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2017 වසරේදී රුපියල් මිලියන 582,417 දක්වා වැඩිවී ඇත. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්වල වාර්ෂිකව 13.55% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 392,400 (2016: රුපියල් මිලියන 345,589) දක්වා වැඩිවී ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් රුපියල් මිලියන 185,767 (2016: රුපියල් මිලියන 173,985) ක් වූ අතර 6.77% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

ප්‍රතිරක්ෂණ ව්‍යාපාරවලට අයත් වත්කම් වලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් හිමිකරගෙන තිබූ වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 4,250 ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට වාර්තා කරන ලද රුපියල් මිලියන 5,616 ක් වූ වත්කම්වලට සාපේක්ෂව 24.32%, ක සැලකියයුතු ඍණාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී.

**ප්‍රස්තාරය 2. - මුළු වත්කම්**



**රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම්**

රක්ෂණ සමාගම් (දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යන අංශ දෙක) විසින් දරන ලද රක්ෂණ හිමිකම්වල මුළු වටිනාකම රුපියල් මිලියන 73,877 (2016: රුපියල් මිලියන 62,962) ක් වූ අතර 17.34% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. කල්පිරීම් සහ මරණ ප්‍රතිලාභ ඇතුළුව දීර්ඝ කාලීන රක්ෂණ හිමිකම් ප්‍රමාණය රුපියල් මිලියන 25,967 ක් විය. (2016: රුපියල් මිලියන 22,485). මෝටර් රථ, ගිනි, සමුද්‍ර සහ අනෙකුත් කාණ්ඩ ඇතුළත් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් තුළ දරන ලද හිමිකම් ගෙවීම් රුපියල් මිලියන 47,910 ක් විය. (2016: රුපියල් මිලියන 40,477). මෙනිසා, 2016 වසර හා සැසඳීමේදී, දීර්ඝ කාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා දරන ලද හිමිකම්වල වටිනාකම පිළිවෙලින් 15.49% කින් සහ 18.36% කින් වැඩිවී ඇත.

**ප්‍රස්තාරය 3 -රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම්**




**රක්ෂණ සමාගම්වල ලාභදායිත්වය**

රක්ෂණ ව්‍යාපාරයේ මුළු ලාභදායිත්වය 78.05% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 47,812 (2016: රුපියල් මිලියන 26,852) දක්වා වැඩි වී ඇත. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ලාභදායිත්වය රුපියල් මිලියන 39,268 (2016: රුපියල් මිලියන 13,616) වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ලාභදායිත්වය රුපියල් මිලියන 8,543 (2016: රුපියල් මිලියන 13,236) ක් විය. මෙලෙස, පසුගිය වසර හා සැසැඳීමේදී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ලාභදායිත්වය 188.41% කින් වැඩිවී ඇති අතර, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ලාභදායිත්වය -35.46% ක සැලකියුතු සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ලාභදායිත්වය තුළ සැලකියයුතු වැඩිවීම සඳහා හේතුව නම් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන රක්ෂකයින්ගේ එකෝවිත අතිරික්තය කොටස් හිමියන්ගේ අරමුදලට මාරු කිරීමයි.

**ප්‍රස්තාරය 4 -රක්ෂණ සමාගම් වල ලාභදායීත්වය**




## ආරවුල් නිරාකරණය සහ විමර්ශන

රක්ෂණ ඔප්පු හිමියන්ගේ බැඳියාවන් සුරක්ෂිත කිරීමේ සිය සමස්ත අරමුණ යටතේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ඔප්පුවලට අදාළ රක්ෂණ හිමිකම් සම්බන්ධව ඔප්පු හිමියන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් විමසා බලයි. ඕනෑම රක්ෂණකරුවෙකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයෙකුට එරෙහිව යොමු කරනු ලබන ඕනෑම වෙනත් පැමිණිල්ලක් සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විමර්ශනය සිදුකරයි. 2017 වසර තුළ, නව කරුණු 348 ක් කොමිසම වෙත යොමු කරන ලදී. කාලපරිච්ඡේදය තුළදී කරුණු 341 ක් විසඳන /අවසන් කරන ලදී. කොමිසමේ මැදිහත් වීම හේතු කොට ගෙන කාලපරිච්ඡේදය තුළ විසඳනලද හිමිකම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන 20ට ආසන්න වේ.

## රක්ෂණකරුවන්

2017 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක වන රක්ෂණ සමාගම් (රක්ෂණ ආයතන) විසි හයක් (26)ක් අතරින්, සමාගම් දොලහක් (12) දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර පමණක් ද සමාගම් දොලහක් (12) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ද පවත්වාගෙන යන අතර, දෙකක් (02) සංයුක්ත සමාගම් වේ. (සාමාන්‍ය සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල යෙදී සිටින).

**රක්ෂණ තැරැව්කරුවන්**

2017 දෙසැම්බර් 31 වන දිනට කොමිෂන් සභාව හා ලියාපදිංචි වූ රක්ෂණ තැරැව්කාර සමාගම් හැට (60) ක් ප්‍රධාන වශයෙන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කරයි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර හරහා උපයන ලද වාරික ආදායම තුළින් සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොළ තුළ මැදිහත්කරුවකු ලෙස තැරැව්කරුවන්ගේ වැදගත්කම පෙන්නුම් කරයි. එසේවුවත්, දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා රක්ෂණ තැරැව්කරුවන්ගේ දායකත්වය පෙර වසරවල දී මෙන් දැකගත නොහැකි විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උපයන ලද වාරික ආදායම රුපියල් මිලියන 22,083 (2016: රුපියල් මිලියන 17,518 )ක් වූ අතර, දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් උපයන ලද වාරික ආදායම රුපියල් මිලියන 341 (2016: රුපියල් මිලියන 263 )ක් විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය යන අංශ දෙකෙන්ම උපයන ලද මුළු වාරික ආදායම පසුගිය වසර තුළ පැවති රුපියල් මිලියන 17,781 ට සාපේක්ෂව 2017 වසරේ දී රුපියල් මිලියන 22,423 ක් විය. මේ අනුව, රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර හරහා උපයන ලද මුළු වාරික ආදායම තුළ 26.1% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර සමස්ත දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස තැරැව්කාර සමාගම්වල දායකත්වය 2017 වසරේ දී 13.62% ක් විය.

*සටහන්:*

*1) 2017 - යාවකාලීන සංඛ්‍යා*

*2) 2016 - නැවත සඳහන් විගණනය කළ සංඛ්‍යා*

*3) අන්තර් ඛණ්ඩ ගනුදෙනු ( ජීවිත සහ සාමාන්‍ය) ඉවත්කිරීම් 2017 වසර සඳහා බලපැමක් නොමැත.*


**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
**11 වන මහළ, නැගෙනහිර කුළුන,**
**ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය**
**කොළඹ 01**

| | |
|---|---|
| වෙබ් අඩවිය:www.ircsl.gov.lk | විද්‍යුත් ලිපිනය:info@ircsl.gov.lk |
| දුරකතනය: 011 2396184- 9 | ෆැක්ස්: 011 2396190 |


2018.10.04